# ශ්‍රී ලංකාවේ මෑතකාලීන උද්ධමනයට හේතු පිළිබඳ විමසීමක්

එස්.එන්.එම්. ප්‍රනාන්දු[1]　　　　ජේ. ආර්.ඊ.එච්. ජයලත් [2]

**සංක්ෂේපය**

සාර්ව ආර්ථික අරමුණු ඉටුකරගනිමින් ඉදිරියට යන රටකට මුහුණ දීමට සිදුවන ප්‍රබල අභියෝගයක් ලෙස උද්ධමනය හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල උද්ධමනයේ බලපෑම ඉහළ මට්ටමක පවතී. මෙහිලා විද්‍යමාන වන අවිනිශ්චිත තත්වය නම් අනාගතයේ දී උද්ධමනය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු යෝග්‍ය ප්‍රතිපත්තිය කුමක් ද යන්නයි. මෙම ලිපිය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මෑතකාලීන උද්ධමන තත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම යි. ඒ අනුව මෙමඟින් ශ්‍රී ලංකාවේ උද්ධමනයට අදාළ මූලික සංකල්ප හා වර්ධනයන් පැහැදිලි කිරීමත්, උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී විග්‍රහයත්, උද්ධමනය තුළින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳ විමසා බැලීමත්, උද්ධමනය නිසා රටට මුහුණ දීමට සිදුවන අභියෝගයන් පිළිබඳවත් සාකච්ඡාවට බඳුන් කෙරේ. මේ සඳහා පොත්පත්, සඟරා, ලිපි, අන්තර්ජාල තොරතුරු වැනි ද්විතීයික දත්ත මූලාශ්‍ර භාවිත කර ඇත. උද්ධමනකාරී තත්වය පිළිබඳව මෙලෙස තොරතුරු විමසා බැලීමේ දී උද්ධමනයට විසඳුම් සෙවීමට අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රයත්න දැරීම කාලීන අවශ්‍යතාවයක් බව පෙනීයයි.

**මුඛ්‍ය පද :** උද්ධමනය, උද්ධමනය වර්ගීකරණය, උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී විග්‍රහය

## හැඳින්වීම

උද්ධමනය යන්නෙන් හඳුන්වනුයේ ආර්ථික ක්‍රමයක් තුළ සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ නැගීමේ උපනතියයි. නැතිනම් මුදලේ ක්‍රය ශක්තිය පිරිහීමයි. සාමාන්‍ය මිල මට්ටමේ සිදුවන අඛණ්ඩ ඉහළයාම උද්ධමනය ලෙස හඳුනාගත්තද ආර්ථික ක්‍රමයක් තුළ සිදුවන සෑම මිල වැඩිවීමක්ම උද්ධමනය ලෙස හැඳින්විය නොහැක. එනම් වෙළඳපොලේ ඉල්ලුම් හා සැපයුම් බලවේගයන් හැඩ ගැසීමට ගතවන කාල පමාව නිසා සිදුවන මිල ඉහළ යාම උද්ධමනය ලෙස හැඳින්විය නොහැක. එනම් ඉල්ලුම් හා සැපයුම් බලවේග නිසියාකාරව හැඩගැසුණු පසු මිල අඩු වීම ඊට හේතුවයි. එසේම පොළි අනුපාතය ඉහළ යනවිට සිදුවන මිල වැඩිවීම ද උද්ධමනය නොවේ. ඊට හේතුව පොළිය වැඩිවන විට ආයෝජන අඩු වී නිෂ්පාදනය පහත වැටෙන බැවිනි. නිෂ්පාදනය අඩු වීම උද්ධමනාත්මක බලපෑමක් නොව එය අවධමනාත්මක බලපෑමකි. මුදල් අවප්‍රමාණයක් කිරීම නිසා සිදුවන මිල

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර, snmfernando@gmail.com

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර, erangijayalath1992@gmail.com

වැඩිවීම ද උද්ධමනය නොවන අතර එයට හේතුව එහිදී මිල වැඩිවනුයේ මුදල් අවප්‍රමාණය කිරීම නිසාය. ඒ අනුව සෑම මිල වැඩිවීමක්ම උද්ධමනය නොවන අතර උද්ධමනය යනු සාමාන්‍ය මිල මට්ටමේ සිදුවන අඛණ්ඩ ඉහළයාමකි.

1968 දී ඇමරිකානු ආර්ථික සංගමය අමතා දේශනයක් කළ "මිල්ටන් ෆ්‍රීඩ්මන්" කියා සිටියේ

"උද්ධමනය යනු සෑම කල්හිම සෑම තැනකම සිදුවන මූල්‍යමය ප්‍රපංචයකි. "

යන මතයයි. මෙලෙස උද්ධමනය යන්නට න්‍යායාත්මකව නිර්වචනයක් සිදුකර තිබේ.

රටක උද්ධමන වේගය මනිනුයේ මිල දර්ශක මගිනි. ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට ප්‍රධාන වශයෙන්ම යොදාගනු ලබන්නේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකයයි. ඊට අමතරව මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරන තොග අලෙවි මිල දර්ශකය හා දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය ද යොදා ගනු ලබයි. කෙසේ වෙතත් මිල දර්ශකයන් සකස් කරන ආකාරයේ දුර්වලතා දත්ත ලබා ගැනීමේ දුර්වලතා නිසා මිල දර්ශක මඟින් සැබෑ උද්ධමනය පිලිඹිබු වීමක් සිදුනොවේ.

ශ්‍රී ලංකාවේ උද්ධමනය තුළින් සාමාන්‍ය මිල මට්ටමට, විනිමය අනුපාතිකයට, පොළී අනුපාතිකයට හා වේතන වලට විශේෂිත බලපෑමක් සිදුවේ. උද්ධමනය සමාජයේ දුර්වල කොටස් වන දිළිඳු ජනතාව පීඩාවට පත් කරන අතර රැකියා විරහිත කොටස් යන්තමින් දිවි ගැටගසා ගන්නා අයද පීඩාවට පත් කරයි. ජනගහනයෙන් 15% ක් පමණ දිවි ගෙවන්නේ දිළින්දන් වශයෙන් ගණන් ගන්නා ආදායම් මට්ටමටද බෙහෙවින් අඩු ආදායම් සීමාවක වන අතර උද්ධමනය ඔවුන්ගේ අල්ප වූ මූර්ථ ආදායම තව දුරටත් ක්ෂය කරයි. එසේම බදු ගෙවන්නන් දක්වනුයේ සියලු බදු අතර අකාරුණිකම බද්ද උද්ධමනය වන බවයි. උද්ධමනය අපනයන සඳහා ඇති තරඟකාරීත්වය අඩුකරන අතර අපනයන කෘතිම වශයෙන් ලාභදායී කරයි. මේ හේතුවෙන් කෙටිකාලීනව ඉහළ පොළියකට ණය ගැනීමට රජයට සිදුවේ. එසේම දේශපාලන හා ආර්ථික අවිනිශ්චිතතාවන් තවදුරටත් උග්‍ර වේ. වර්තමානයේ අප ඉදිරියේ ඇති අභියෝගය වනුයේ උද්ධමන වේගය අඩුකිරීම හෝ රටට ඔරොත්තු දිය හැකි බාහිර සමතුලිතතාවන් යලි ඇති කර ගැනීමට ක්‍රියා කිරීම යි.

**උද්ධමනය පිළිබඳ විවිධ න්‍යායන් හා උද්ධමන වර්ග**

පොදු මිල මට්ටම්වල නොකඩවා ඉහළ යන ප්‍රවණතාව "මිල උද්ධමනය" ලෙස හඳුන්වන අතර උද්ධමනයට හේතු ඉල්ලුම් හා සැපයුම් පාර්ශව වශයෙන් දළ කොටස් දෙකකින් සලකා බැලිය හැකිය. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයේදී ඉල්ලුම් බලවේග සැපයුම අභිබවා ඉල්ලුම ඉහළ යාමකින් මිල ඉහළ යා හැකිය. අධි ඉල්ලුමක් නිසා පොදු මිල මට්ටම් ඉහළ යාම "ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය" ලෙස

හඳුන්වයි. උද්ධමනය පටන් ගැනීමේ සිට අවසානය දක්වා එයට හේතු වූ කරුණු වෙන්කොට හඳුනාගැනීම ඉතා දුෂ්කර හෙයින් උද්ධමන න්‍යායන් රාශියක් හා මත කිහිපයක් දක්නට ලැබේ. මේ පිළිබඳව පැරණි න්‍යායන් කිහිපයකි.

1. පැරණි මුදල් ප්‍රමාණවාදී මත

2. කේන්සියානු මත

3. නව මූල්‍යවාදී මත

4. පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය

5. ව්‍යුහවාදීන්ගේ මත

1. **මුදල් ප්‍රමාණවාදී මත**

පැරණි මතවාදීන් අතරින් මේ පිළිබඳව වඩාත් සංවිධානාත්මකව කරුණු ඉදිරිපත් කළ ආචීර්ණ කල්පිත ගුරුකුලය ලෙෂ මුදල් ප්‍රමාණවාදීන් පෙන්වා දිය හැකිය. ආචීර්ණ කල්පිත මුදල් ප්‍රමාණවාදීන්ගේ අදහස වූයේ මුදල් සැපයුම හා මිල මට්ටම අතර ඍජු ධන සම්බන්ධතාවක් ඇති බවයි. නිෂ්පාදනය හා මුදල් සංසරණ ප්‍රවේගය ස්ථාවර වූ අර්ථ ක්‍රමයක මුදල් සැපයුම ඉහළ යාමත් සමඟ මිල මට්ටම් ඉහළ යන බව ඔවුන්ගේ අදහස විය. අර්වින් ෆිෂර් ප්‍රමුඛ මුදල් ප්‍රමාණවාදී ආර්ථික විද්‍යාඥයින් විසින් අර්ථක්‍රමය තුළ දිගුකාලයක් තුලදී පූර්ණ සේවා නියුක්තියක් ඇතැයි උපකල්පනය කරනු ලැබීය. එනම් ,

$$MV=PT$$

ලෙස මුදල් ප්‍රමාණවාදී සමීකරණය ඉදිරිපත් කර තිබේ.

M = මුදල් සැපයුම

V = මුදලේ සංසරණ ප්‍රවේගය

P = මිල මට්ටම

T = මුලු නිෂ්පාදිතය

මිල මට්ටම්වල ඉහළ යාමට එකම හේතුව මුදල් සැපයුමය යන්න මෙම ගුරුකුලය විසින් පිළිගන්නා ලදි.

**2. කේන්සියානු උද්ධමන විශ්ලේෂණය**

1936 දී J.M.කේන්ස් විසින් පළකරන ලද "සේවා නියුක්තිය , පොළී ප්‍රමාණය හා මුදල් පිළිබඳ පොදු න්‍යාය" යන ග්‍රන්ථයෙන් හා 1910 දී පළකරන ලද "යුද්ධය හා වන්දි ගෙවීම්" යන ග්‍රන්ථයෙන් උද්ධමනය පිළිබඳ කරුණු විමර්ශනය කරන ලදී. කේන්ස්ගේ උද්ධමනය පිළිබඳ කරුණු ආදායම් වියදම් විශ්ලේෂණය ආශ්‍රයෙන් සලකා බලා ඇත. සමස්ත සැපයුම ඉක්මවා සමස්ත ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් උද්ධමනය ඇතිවන බව මෙම න්‍යායේ හරයයි. පූර්ණ සේවා නියුක්ති අවස්ථාවට ඒමෙන් පසු සමස්ත සැපයුම ඉහළ දැමීම දුෂ්කර බවත් ඉන් ඔබ්බට සමස්ත ඉල්ලුම ඉහළ යාමෙන් සිදුවන්නේ මිල මට්ටම් ඉහළ යාම බවත් මින් කියැවේ.

**4. පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය**

මූල්‍යවාදීන්ගේ උද්ධමනය පිළිබඳ මූල්‍ය න්‍යායන් දළ කේන්සියානු මතයන් යන දෙකට පසු විශේෂ අවධානයට ලක් වූ උද්ධමන විශ්ලේෂණයක් ලෙස පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය ගැනේ . මෙම මතය න්‍යායන් පසුබිම් කරගත් විශ්ලේෂණයට වඩා පර්යේෂණ අධ්‍යනයන්හි ප්‍රතිඵල මත පදනම් කරගෙන ඉදිරිපත් කිරීමකි. බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥයෙකු වන A.W.H. පිලිප්ස් නමැත්තා එවකට බ්‍රිතාන්‍යයෙහි දිගු කලක් තිස්සේ පැවති ආර්ථික ගැටලුවක් වූ උද්ධමනය හා සේවා වියුක්ති ප්‍රශ්නය අතර සම්බන්ධතාවය සොයා බලන ලද අතර එමඟින් මුදල් වැටුප් වෙනස් වීමේ අනුපාතික හා සේවා වියුක්ති මට්ටම් අතර දැඩි සමීප බවක් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සේවා වියුක්තිය ඉහළ මට්ටමකට වඩා පහළ මට්ටමක පවතින විට වැටුප් වේගයෙන් ඉහළ යන බැව් පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය පවසයි.

**සැපයුම් බලවේග**

1. **සැපයුමෙන් තල්ලු වූ උද්ධමනය**

දිගු කලක් තිස්සේ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය විශ්ලේෂණය පිළිබඳව පිළිගැනීමක් තිබුණත් 1960 , 1970 ගණන් වලදී එවැනිම අවධානයක් සැපයුමෙන් තල්ලු වූ උද්ධමන සාධක වෙත යොමු විය. වේගයෙන් ඉහළ ගිය තෙල් මිල අනුව 1970 ගණන් වලදී මිල මට්ටම් ඉහළ යාම් , ධාන්‍ය පාලු වීම් මත සැපයුම් ඇනහිටීමෙන් මිල ඉහල යාම් , විවිධ ඒකාධිකාරී තත්වයන් නිසා මිල ඉහළ යාම්, වෘත්තීය සමිති කේවල් කිරීම් නිසා වූ මිල ඉහළ යාම් ද සැපයුමෙන් තල්ලු වූ උද්ධමන සාධක වේ. මෙම උද්ධමන වර්ග ඒවා ඇතිවන හේතු මත වර්ග කළ හැක . උදාහරණ ලෙස ලාභයෙන් තල්ලු වූ උද්ධමනය , වැටුපෙන් තල්ලු වූ උද්ධමනය, භාණ්ඩ උද්ධමන , වියදම් තල්ලු වීමේ මායාව හා පරිපාලන මිල උද්ධමන ලෙස ඉදිරිපත් කළ හැකිය.

## උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී විග්‍රහය

වර්තමාන ලෝක ආර්ථිකය තුළ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල දිගුකාලීනව පවතින උද්ධමනයට හේතු විග්‍රහ කිරීම සඳහා උද්ධමනය පිළිබඳ ඉල්ලුම් න්‍යාය හෝ උද්ධමනය පිළිබඳ පිරිවැය න්‍යාය යොදාගත නොහැකි බව පෙන්නුම් කරන නව මාක්ස්වාදී ව්‍යුහවාදී ආර්ථික විද්‍යාඥයන් පෙන්නුම් කරන්නේ ඌන සංවර්ධිත රටවල උද්ධමනයට හේතු විග්‍රහ කිරීම සඳහා උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී විග්‍රහය යොදාගත යුතු බව නව මාක්ස්වාදී ව්‍යුහවාදී ආර්ථික විද්‍යාඥයන් පෙන්නුම් කරයි.උද්ධමනය පිළිබඳ ව්‍යුහවාදී විග්‍රහයට අනුව ඌන සංවර්ධිත රටවල පවතින උද්ධමනයට ප්‍රධානතම හේතුව මෙම රටවල ආර්ථික ව්‍යුහයේ පවත්නා ව්‍යුහමය දුර්වලතාවන් බවයි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථික ව්‍යුහයේ පවත්නා ප්‍රධානතම දුර්වලතාව නම් මෙම රටවල දේශීය නිෂ්පාදන ව්‍යුහයේ පවත්නා සැපයුමේ අනම්‍ය බවයි. එනම් ශ්‍රී ලංකාව වැනි රටවල දේශීය වශයෙන් වැඩිවන ඉල්ලුමට සරිලන ප්‍රමාණයෙන් දේශීය සැපයුම හැඩගස්වා ගැනීමට නොහැකි වීමයි. ශ්‍රී ලංකාව වැනි රටවල දේශීය වශයෙන් ආහාර සඳහා වැඩිවන ඉල්ලුම වෙනත් අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා වැඩිවන ඉල්ලුම ප්‍රාග්ධනය තාක්ෂණය හා විදේශ විනිමය සඳහා වැඩිවන ඉල්ලුම ආදී වශයෙන් මෙම රටවල දේශීය වශයෙන් වැඩිවන ඉල්ලුමට සරිලන ප්‍රමාණයෙන් දේශීය සැපයුම හැඩගස්වා ගැනීමට නොහැකි වීම මත මෙම රටවල ව්‍යුහාත්මක උද්ධමනයක් ඇතිවේ. ඒ හැරුණු විට ශ්‍රී ලංකාව වැනි රටවල නිෂ්පාදන සාධක වෙළඳපලේ ද ව්‍යුහමය දුර්වලතාවක් පවතී. එනම් ශ්‍රී ලංකාව වැනි රටවල් සාධක වෙළඳපලේ පවතින සාපේක්ෂ සාධක මිල මඟින් මෙම රටවල සාපේක්ෂ සාධක හිමිකම හරියාකාරව නිරූපණය වන්නේ නැත. එනම් ශ්‍රී ලංකාව වැනි රටවල සාපේක්ෂ වශයෙන් ප්‍රාග්ධනය හිඟවන අතර සාපේක්ෂව ශ්‍රමය බහුලය. මෙම තත්වය යටතේ ශ්‍රී ලංකාව වැනි රටවල ප්‍රාග්ධනයේ මිල එනම් පොලී අනුපාතය ඉතා ඉහල මට්ටමක පැවතිය යුතු අතර ශ්‍රමය සඳහා වැටුප් ඉතා අඩු මට්ටමක පැවතිය යුතුයි. නමුත් ශ්‍රී ලංකාව වැනි රටවල ප්‍රාග්ධනයේ මිල එනම් පොලී අනුපාතය සාපේක්ෂව ප්‍රාග්ධනය බහුල ඇමෙරිකාව වැනි රටවල පොළී අනුපාතයට සමාන මට්ටමක පවතී. එමෙන්ම ශ්‍රී ලංකාව වැනි රටවල පොලී අනුපාතය දෙස පමණක්ම අවධානය යොමු කළහොත් ඒ තුළින් ගම්‍ය වනුයේ ශ්‍රී ලංකාව වැනි රටවලද සාපේක්ෂව ප්‍රාග්ධනය බහුල බවයි. නමුත් සැබෑ තත්වය වන්නේ මෙම රටවල සාපේක්ෂව ප්‍රාග්ධනය හිඟවන අතර විදේශීය ප්‍රාග්ධනය මත දැඩි රුඳියාවක්ද දක්වීමට සිදුව තිබීමයි. ඒ හැරුණු විට ශ්‍රී ලංකාව වැනි රටවල සාපේක්ෂව ශ්‍රමය බහුල වුවත් මෙම රටවල නාගරික අංශයේ ඉහළ වැටුප් මට්ටම් පවතී. එමෙන්ම මෙම රටවල නාගරික අංශයේ ඉහළ වැටුප් මත භාණ්ඩ නිෂ්පාදනයේදී ඉහළ නිෂ්පාදන පිරිවැයක් තුළින් මිල ගණන්ද ඉහළ මට්ටමක තීරණය වේ. මෙම ව්‍යුහමය දුර්වලතා අනුව ප්‍රධාන වශයෙන්ම මෙම රටවල දේශීය නිෂ්පාදන ව්‍යුහයේ පවත්නා සැපයුමේ අනම්‍ය බව නිසා මෙවන් රටවල් දැඩිවම විදේශීය රටවල් මත රඳා පැවතීමට සිදුවී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාව වැනි රටවල පෞද්ගලික අංශයේ ආදායම් වැඩිවීම රාජ්‍ය අයවැය හිඟය මඟින් රජයේ වියදම් මට්ටම මුදල් සැපයුම වැඩිවීම වැනි හේතු නිසා දේශීය වශයෙන් ආහාර ද්‍රව්‍ය සඳහා ඉල්ලුම වැඩිවීම අතරමැදි භාණ්ඩ හා ආයෝජන

භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩිවීම, වෙනත් අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩිවීම, ප්‍රාග්ධනය , තාක්ෂණය හා විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩිවීම දිගින් දිගටම සිදුවන අතර එසේ වැඩිවන ඉල්ලුමට සරිලන ප්‍රමාණයෙන් දේශීය සැපයුම හැඩගස්වා ගැනීමට හැකියාවක් පවතී නම් ඉල්ලුම් උද්ධමනයක් ඇති නොවේ. ඒ අනුව ඉල්ලුම් උද්ධමනය ඇති වන්නේ ව්‍යුහමය දුර්වලතා නිසාය. එම නිසා මෙම රටවල වැඩිවන දේශීය ඉල්ලුමට සරිලන පරිදි දේශීය සැපයුම හැඩගස්වාගත නොහැකි නිසා උද්ධමනය ඇතිවන අතර වැඩිවන දේශීය ඉල්ලුමට අනුව සැපයුම හැඩගස්වා ගැනීමට ශ්‍රී ලංකාව වැනි රටවලට ආනයන මත දැඩිව රඳා පැවතීමට සිදුවන අතර විදේශීය ප්‍රාග්ධනය විදේශීය තාක්ෂණය , විදේශීය ණය හා ආධාර මත රඳා පැවැත්මට සිදු වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව වැනි රටවල දේශීය ඉල්ලුම වැඩිවීම මඟින් මිල මට්ටම වැඩිවන අතරම මෙම රටවල් ආනයන මත රඳාපැවැත්ම නිසා දේශීය ඉල්ලුම වැඩිවීමත් සමඟ ආනයන ඉල්ලුම වැඩි වේ. ආනයන ඉල්ලුම වැඩිවීම මඟින් විදේශ විනිමය ඉල්ලුම වැඩි වී මෙම රටවල විනිමය අනුපාත ඉහළ යාම මඟින් දේශීය මුදලේ විදේශීය අගය දිගටම පහත බැසීම මඟින් මෙම රටවල ආනයනය කරන භාණ්ඩවල දේශීය මිල ගණන් වැඩි වී ආනයන ආශ්‍රිත උද්ධමනයේ බලපෑමද වැඩි වී ඇත. ඒ හැරුණු විට ශ්‍රී ලංකාව වැනි රටවල නිෂ්පාදන පිරිවැයද දිගටම වැඩිවීමේ උපනතියක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාව වැනි රටවල නිෂ්පාදන පිරිවැය වැඩිවීමේ හේතු සලකා බැලීමේ දී මෙම රටවල රජය හා පෞද්ගලික අංශ වැටුප් වැඩිවීම නිෂ්පාදන පිරිවැය සඳහා ප්‍රධාන බලපෑමක් ඇති නොවන අතර නිෂ්පාදන පිරිවැය වැඩිවීමට ප්‍රධාන බලපෑමක් ඇති නොවන අතර නිෂ්පාදන පිරිවැය වැඩිවීමට ප්‍රධාන ලෙෂ හේතු වන්නේ අතරමැදි භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ පිරිවැය, බලශක්ති පිරිවැය විශාල ලෙස වැඩිවීමයි. ශ්‍රී ලංකාව වැනි රටවල නිෂ්පාදන ක්‍රියාවලින් තුළ බහුලව යොදාගනු ලබන්නේ ආනයනික ප්‍රාග්ධන භාණ්ඩ , යන්ත්‍රසූත්‍ර , ආනයනික අතරමැදි භාණ්ඩ හා ආනයනික බලශක්ති මූලාශ්‍ර වේ. ඒ අනුව ශ්‍රී ලංකාව වැනි රටවල නිෂ්පාදන පිරිවැය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ ආනයන මිලගණන් වැඩිවීමයි. ආනයන මිල ගණන් වැඩිවීමේ ප්‍රශ්නයට හේතු වන්නේ මෙම රටවල් ආනයන මත දැඩිව පැවතීමයි. ආනයන මත රඳා පැවැත්මට සිදුව ඇත්තේ මෙම රටවල ආර්ථික ව්‍යුහයේ දුර්වලතා නිසාය.ඒ අනුව ශ්‍රී ලංකාව වැනි රටවල පවතින උද්ධමනය මෙම රටවල ආර්ථික ව්‍යුහයේ දුර්වලතා මත බිහිවන ව්‍යුහාත්මක උද්ධමනයක් වන අතර එම දුර්වලතා නිසා ජාත්‍යන්තර පරිමාණව පවතින උද්ධමනය ද මෙම රටවල ආනයනය වීමක් සිදුවේ.

**උද්ධමන ක්‍රියාවලිය හා එහි ප්‍රතිවිපාක**

උද්ධමනය සමබන්ධයෙන් වර්තමානයේ පවතින්නා වූද, දිගින් දිගටම අඛණ්ඩව පවතින්නා වූද ක්‍රියාවලීන් ඇතුලුව ඉකුත් තිස් වසර පුරා ශ්‍රී ලංකාව උද්ධමන ක්‍රියාවලීන් 4 ක් අත්විඳ ඇත. ඒවා නම් 1973-1975 උද්ධමන ක්‍රියාවලිය, 1980-1981 උද්ධමන ක්‍රියාවලිය , 1988-1989 උද්ධමන ක්‍රියාවලිය සහ මෑතකදී ඇති වී දිගටම ක්‍රියාත්මක වන 2006-2008 උද්ධමන ක්‍රියාවලියයි.

1973-1975 ක්‍රියාවලිය සම්බන්ධ වන්නේ ඛනිජ තෙල් පිළිබඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යන ඔපෙක් රටවල් මාස කීපයක් ඇතුළත තෙල් මිල සිව් ගුණයකින් වැඩි කිරීමෙන් පසුව අත්විඳි ප්‍රථම තෙල් කම්පනයට හෙවත් තෙල් ප්‍රහාරයටයි. 1970

දී ඩොලර් 2.72 ක් ව තිබූ තෙල් බැරලයක මිල 1972 දී ඩොලර් 10.70 දක්වා ඉහළ ගියේය. එවකට ශ්‍රී ලංකාවේ තිබුණේ සංවෘත ආර්ථිකයකි. එකල රටේ ජාතික නිමැවුම සහ සේවා වියුක්තිය විශේෂයෙන්ම තෙල් ඇතුලු ව සියලු ආනයන වල ජාත්‍යන්තර මිල ගණන් කෙරෙහි එතරම් රඳා පැවැත්මක් නොතිබුණි. එසේ වුවත් ආර්ථිකය කෙරෙහි ඇති වූ ප්‍රබල බලපෑම හේතුකොටගෙන උද්ධමන අනුපාතිකය 11.0 % දක්වා ඉහළ ගියේය. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය හඳුන්වා දීමෙන් පසුව උද්ධමන අනුපාතිකය මේ තරම් ඉහළ මට්ටමකට නැගුනු ප්‍රථම අවස්ථාව මෙයයි. ඒ අවස්ථාවේදී රජය බදු වැඩි කිරීමෙන් (රාජ්‍ය මූල්‍ය හිඟය අඩු කිරීම සඳහා) හා මිල පාලන ඇති කිරීමෙන් උද්ධමනය පාලනය කිරීමට දැඩි පියවර ගත්තේය.

දෙවැනි උද්ධමන කාල පරාසය තුළ උද්ධමන අනුපාතිකය 22.1 % ක් දක්වා වැඩි වීමට සාධක දෙකක් හේතු විය. නිදහසින් පසුව කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය හඳුන්වා දීමෙන් පසුව වාර්තා කළ ඉහළම අනුපාතිකය එයයි. මූල්‍ය මෙහෙයුම්වල ප්‍රසාරණාත්මක බලපෑම , නිදහසින් පසුව වාර්තා කළ ඉහළම අගය විය. සමස්ත මූල්‍ය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 23.1 % ක් විය. මෙම ප්‍රසාරණයට හේතු වූ සාධකය වූයේ මහවැලි ව්‍යාපාරය සහ එබඳු වෙනත් පොදු වැය ශීර්ෂයන් වැනි විශාල ආයෝජන ව්‍යාපෘති රජය විසින් ආරම්භ කිරීම නිසා රජයේ වැය පක්ෂය අතිශයින් ඉහළ යාමයි. දෙවැනි තෙල් මිල ගණන් ඉහළ යෑම නිසා ඇති වූ කම්පනයේ අහිතකර බලපෑම (මේ නිසා ශුද්ධ විදේශීය වත්කම් පහත වැටුණි.) වැඩි වූ රාජ්‍ය වියදම් නිසා ඕනෑවටත් වඩා සමනය විය.

තුන්වැනි උද්ධමන කාල පරාසය තුළ වඩාත් කැපී පෙනුනේ රජයේ වියහියදම් විශාල වශයෙන් ප්‍රසාරණය වීමයි. තෙල් මිල ඉහළ යාම නිසා ඇති වූ කම්පන දෙක මඟහැරී ගිය අතර 1988-1989 දී පැවති 12.8 % වූයේ විදේශීය වෙළඳ අනුපාතය මුල් කරගෙන වුවත් තුන්වැනි උද්ධමන ක්‍රියාවලිය උද්ගත වීමට වැඩි වශයෙන් හේතු වූයේ මහවැලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමේ උච්චතම අවස්ථාවේදී විශාල වශයෙන් ආධාර ගලා ඒම නිසා විද්‍යාමාන වූ ලන්දේසි ව්‍යාධිය බව කිව හැකිය. එනම් මූර්ථ විනිමය අනුපාතිකයේ අගය වැඩිවීමයි. එයට හේතුව රට වෙත ගලා ආ ශුද්ධ ප්‍රාග්ධනය මුදල්වලට හැරවීමය. මේ හා අදාළ මුදල් සම්භාරය අති විශාල වූ බැවින් රජයේ සුරැකුම්පත් විකිණීම තුළින් මුදල් ගලා ඒම අකර්මන්‍ය කිරීමට යෑම සාර්ථක නොවීමට ඉඩ තිබුණා පමණක් නොව එසේ කළේ නම් පොළී අනුපාතිකයන් ඉහළ ගොස් පෞද්ගලික අංශය කෙරෙහි සෑහෙන බරක් පැටවීමට ඉඩ තිබුණි.

සිව්වන හෙවත් වත්මන් උද්ධමන ක්‍රියාවලිය 2006 දී ආරම්භ වී 2008 වසරේ මැද භාගය දක්වා අඛණ්ඩව පැවතුණි . නැවත දේශීය ප්‍රසාරණාත්මක ප්‍රතිපත්ති සමඟ ඒකාබද්ධව බලශක්ති මිල ගණන් හා කෘෂිකාර්මික මිල ගණන් ඉහළ යාම නිසා කොළඹ පාරිභෝගික මිල දර්ශක අනුපාතිකය 30 % දක්වා ඉහල ගිය අතර 2008 අප්‍රේල් මාසය වනවිට කොළඹ පාරිභෝගික මිල දර්ශකය (නව) 2006 දී 13.7%

දක්වා ඉහළ ගිය අතර 2007 දී එය 18.8 % දක්වා ඉහළ ගියේය. විදේශ රටවලින් ලබාගන්නා ණය තුලින් ගලාගෙන එන විදේශ මුදල් වලින් කොටසක් අකර්මන්‍ය කිරීම සඳහා ප්‍රයත්නයක් දැරුවද , ඒ හේතුකොටගෙන , දේශීය පොළී අනුපාතිකයන් ඉහළ යාමෙන් රාජ්‍ය අංශයේ වපසරිය වැඩිවිය.

**උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක**

උද්ධමනයන් නිසා ඇතිවිය හැකි ආදීනව ආර්ථික , දේශපාලනික හා සමාජීය වශයෙන් කොටස් කළ හැකි අතර වැඩි අවධානයක් යොමු වනුයේ ආර්ථික ප්‍රතිවිපාක කෙරෙහිය. ප්‍රායෝගිකව ගත් කල උද්ධමනයේ ප්‍රතිවිපාක බෙහෙවින්ම අවාසිදායක වේ. සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් බෙදී නොයාම මෙවන් අවස්ථාවලදී දැකිය හැකි ය. සෙමින් ඇතිවන උද්ධමන අවස්ථාවකට වඩා මෙය බෙහෙවින් අදාළ වනුයේ ජවන උද්ධමන අවස්ථාවලදී ය. සියලුම අංශවල මිල ඉහළ යාමක් නොමැති විට වැඩි ලාභ ලැබිය හැකි අංශවල ආයෝජනය කිරීමට නිෂ්පාදකයෝ පෙළඹෙති. එසේම ජවන උද්ධමන අවස්ථා වලදී අනාගතයේ මුදල් වටිනාකම නැතිවී යාම පිළිබඳ පවතින අස්ථායිතා හේතුවෙන් ආරක්ෂිත මාර්ගවල ජනතාව මුදල් යෙදවීමක් සිදු කරයි. එසේම ජීවන වියදම් හේතුවෙන් ඉතිරිකිරීම් පහළ වැටීම නිසා ආයෝජන පහළ යාම වැනි තත්වයන් තුළ රටේ අනාගත නිෂ්පාදන ධාරිතාව පහළ යාමක් සිදුවිය හැකි ය. උද්ධමනකාරි අවස්ථා වලදී ඒ සමඟම මුදල් ආදායම වර්ධනය නොවීම නිසා ජනතාවගේ ජීවන තත්වය දුෂ්කර වේ. මෙම තත්වය හමුවේ මංකොල්ලකෑම්, සොරකම්, අපරාධ වැනි අර්බුදකාරී තත්වයන් සේම ජනතාවගේ සෞඛ්‍ය තත්වය පිරිහීම වැනි ප්‍රහල බලපෑම් සිදුවේ. උද්ධමනය රටක විවිධ ජනකොටස් වලට එක හා සමාන අයුරින් බලනොපාන අතර ඔවුන්ගේ ජීවන තත්වයන් පෙර තිබූ තත්වයටත් වඩා පරිහානියට පත්වීම නොවැලැක්විය හැකි ය. උද්ධමනකාරී තත්වයන්වල දී දේශීය ණය ගැනුම් ඉහළ යාම තුළින් මූල්‍ය හිඟයන් ඇතිවිය හැකි අතර එවිට ආර්ථිකයට උත්පාත අවපාත තත්වයන්ට මුහුණ දීමට සිදුවේ. එසේම දේශීය අසමතුලිතතාව හා අනිවාර්යෙන්ම ඇතිවන විදේශ ගෙවුම් ශේෂ අර්බුදය හමුවේ වෙළඳ හා විනිමය සීමා කිරීම් පැනවීමට රජයට සිදුවන හෙයින් එය රටේ අනාගත ආර්ථික දියුණුවට ප්‍රබල බාධකයක් වන බව පැහැදිළි ය.

**සමාලෝචනය**

අනෙකුත් ඕනෑම විවෘත අර්ථ ක්‍රමයක මෙන්ම ශ්‍රී ලංකාවේ මිල උද්ධමනය කෙරෙහිද බාහිර හා අභ්‍යන්තර හේතු යන දෙවර්ගයම බලපා තිබේ. ශ්‍රී ලංකාවේ මිල උද්ධමනය කෙරෙහි බලපාන අභ්‍යන්තර කරුණු ලෙස මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය කටයුතු ප්‍රධාන තැනක් ගන්නා අතර මුදල් සැපයුම ඉහළ යන විට සමස්ත භාණ්ඩ හා සේවා සැපයුම ඒ හා සමානව ඉහළ නොයයි නම් දේශීය මිල මට්ටම් ඉහළ යයි. මීට අමතරව බාහිර හේතුන් ද මූල්‍ය ප්‍රසාරණයට බලපාන බව සත්‍යයකි. 1970 ගණන් වලදී බැංකු ක්‍රමය සතු විදේශ වත්කම් වැඩිවීමත්, ජාත්‍යන්තර වෙළඳ කටයුතු සඳහා බැංකු ණය ලබා ගැනීමත් මෙම බාහිර සාධක අතර ප්‍රධාන වේ. ආනයන, අපනයන මත රැඳුනු කුඩා අර්ථ ක්‍රම වලට ලෝක වෙළඳපල මිල ගණන් හමුවේ ස්වාධීනව සිටීමේ ශක්තිය අඩු අතර ශ්‍රී ලංකාවේ උද්ධමනය සම්බන්ධයෙන් ලෝක වෙළඳපළ

මිල ගණන් ඉහළ යාම රුපියලේ බාහිර අගය පහත වැටීමට බලපා තිබේ. ලෝක උද්ධමනය හේතුවෙන් දේශීය අපනයනකරුවන්ගේ අපනයන ආදායම් ඉහල යාම ද, එනිසා දේශීය භාණ්ඩ හා සේවා සඳහා ඉහළ යන ඔවුන්ගේ ක්‍රයශක්තිය ද මිල ඉහළ යාමට හේතු වේ. අපනයන ආදායම් ඉහළයත්ම බැංකු සතු විදේශ වත්කම් ඉහළ යාම මුදල් සැපයුමේ ප්‍රසාරණයට හේතු වේ.

ඉහත කරුණුවල සමස්ත ප්‍රතිඵලයක් ලෙස 1970 මුල සිට ශ්‍රී ලංකාවේ මිල මට්ටම්වල වෙනස් වීමට අභ්‍යන්තර හා බාහිර හේතු රාශියක් බලපෑ බව පැහැදිලි වේ. ඒ අනුව බලන විට ශ්‍රී ලංකාවේ රජය , මහ බැංකුව වැනි වගකීම් දරන්නන් උද්ධමනය පහත හෙළීමට අවශ්‍ය නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ වලට එළඹිය යුතුය. ඒ අනුව ශක්තිමත්ව හා විධිමත්ව උද්ධමනයට හේතු වන බාහිර හා අභ්‍යන්තර සාධක පිළිබඳ විමර්ශනය කළ යුතු අතර උද්ධමනයේ අනිටු ප්‍රතිවිපාක අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඉන්ද්‍රරත්න ,ඒ.ඩී.වී. (1965) , "*ආර්ථික ප්‍රශ්න* ", ඇම්.ඩී. ගුණසේන සහ සමාගම,කොළඹ.

ඊරියගම,තිස්ස. (1987), "*ආර්ථික විද්‍යා සාරය* " , උසස් අධ්‍යාපන මණ්ඩලය.

ගුණසේකර, එච්.එම්, ලක්ෂ්මන් , ඩබ්ලිව්.ඩී. ප්‍රනාන්දු, පී.ඩබ්ලිව්,(1976), "*ආර්ථික විද්‍යාව II කොටස*", අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ජයවර්ධන, ආර්.ආර්. (1995)" "*ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන හා නව ආර්ථික රටාව* ", රණ්බණ්ඩාර එන්ටර්ප්‍රයිසස්.

හෙට්ටිහේවා, සමන්තලාල්. (1987)" "*සාර්ව ආර්ථික විද්‍යාව* ", තරංජී ප්‍රින්ටර්ස් , අංක 37, ශ්‍රී සෝරත මාවත, නුගේගොඩ.